# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120<br>2171635 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1524/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திக<br>Date | 30/09/2024<br>පැය 0530 | | |

# මාධ්‍ය නිවේදනය

## 01. හෙරොයින්, අයිස් මත්ද්‍රව්‍ය සහ මත්පෙති සමඟ සැකකරුවන් 04 දෙනෙකු සහ සැකකාරියක් අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2024.09.29 වන දින ගල්කිස්ස පොලිස් වසමේ ගල්කිස්ස, රත්මලාන හා කොතලාවල පුර ප්‍රදේශවලදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරු මත වැටලීම් 05 ක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 21 මිලිග්‍රෑම් 350 ක්, හෙරොයින් ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 250 ක්, හෙරොයින් ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 700 ක් සහ මත් කරල් 1000 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් 04 දෙනෙකු සහ හෙරොයින් ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 300 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 27, 30 හා 46 වයස්වල පසුවන අතර සැකකාරිය වයස අවුරුදු 44 ක් වන රත්මලාන, අඟුලාන හා මොරටුව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. අයිස් මත්ද්‍රව්‍ය, කොකේන් සහ මත්පෙති සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් විශේෂකාර්ය බලකා කඳවුර.

2024.09.29 වන දින අළුයම් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 17 මිලිග්‍රෑම් 600 ක්, කොකේන් ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 05 ක් සහ ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 08 ක් බර මත්පෙති සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වූ දෙමටගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.09.29 වන දින උදෑසන කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ අත්තිඩිය ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 800 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන අත්තිඩිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. නීති විරෝධී ලෙස මෙරටට ගෙන්වන ලද දුම්වැටි සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය.**

2024.09.29 වන දින සවස් කාලයේ කටුනායක ගුවන්තොටුපල පරිශ්‍රයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර ඉන්දියාවේ සිට මෙරටට රැගෙන එන ලද **දුම්වැටි 6000ක් ( කාටුන් 30) සමඟ සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 52 ක් වන මිනුවන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. විදේශ රටක නිෂ්පාදිත පිස්තෝල අවියක් සහ සජීවී පතරොම් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මූලස්ථානය.**

2024.09.29 වන දින උදෑසන කාලයේ වැලිවේරිය පොලිස් වසමේ ජයබිම, කිරිකිත්ත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා මූලස්ථාන කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **විදේශ රටක නිෂ්පාදිත පිස්තෝල වර්ගයේ අවියක් හා එම සජීවී පතරොම් 06 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැලිවේරිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන ජයබිම, කිරිකිත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැලිවේරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**06. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සහ සජීවී පතරොම් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ජයවර්ධනපුර පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර.**

2024.09.29 වන දින සවස් කාලයේ මීගහවත්ත පොලිස් වසමේ ගොළුම්මහර ප්‍රදේශයේදී ජයවර්ධනපුර පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සහ සජීවී පතරොම් 02 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මීගහවත්ත පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන දෙල්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීගහවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 07. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරගහහේන පොලිස් ස්ථානය.

2024.09.29 වන දින සවස් කාලයේ මොරගහහේන පොලිස් වසමේ මිල්ලැව ප්‍රදේශයේදී මොරගහහේන පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 60 ක් (බෝතල් 80) සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 53 ක් වන මිල්ලැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරගහහේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මීගලෑව පොලිස් ස්ථානය.

2024.09.29 වන දින සවස් කාලයේ මීගලෑව පොලිස් වසමේ කුඩාකත්නෝරුව ප්‍රදේශයේදී මීගලෑව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 45 ක් (බෝතල් 60) සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන මීගලෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීගලෑව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. දියේ ගිලී මියයාමක් - මස්කෙළිය පොලිස් වසම.

2024.09.29 වන දින දහවල් කාලයේ මස්කෙළිය පොලිස් වසමේ බ්‍රවුන්ස්වික් ප්‍රදේශයේ මාඋස්සාකැලේ ජලාශයේ කාන්තාවක් මියගොස් ඇති බවට ලද පණිවිඩයක් මත මස්කෙළිය පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 50 ක් වන බනියන් වත්ත, මස්කෙළිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු දික්ඔය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මස්කෙළිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. නාඳුනන මළ සිරුරක් - නවගමුව පොලිස් වසම.

2024.09.29 වන දින උදෑසන කාලයේ නවගමුව පොලිස් වසමේ පෝරේ ප්‍රදේශයේ හිස් ඉඩමක පිරිමි මෘත ශරීරයක් ඇති බවට 119 තොරතුරු මධ්‍යස්ථානයෙන් ලද පණිවිඩයක් මත නවගමුව පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත. පොලිස් නිලධාරීන් එම ස්ථානයට ගොස් පරීක්ෂා කිරීමේදී මෘත ශරීරය හඳුනා ගත නොහැකි තත්ත්වයේ තිබී ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂනය සිදු කිරීමට නියමිතව ඇත. නවගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. මාරක රිය අනතුරක් - මීගොඩ පොලිස් වසම.

2024.09.29 වන දින උදෑසන කාලයේ මීගොඩ පොලිස් වසමේ කොළඹ පාදුක්ක 125 මාර්ගයේ මහදෙණිය ප්‍රදේශයේදී මාර්ගය අයිනේ නවතා තිබූ යතුරු පැදියක් එක්වරම මාර්ගයට ගැනීමේදී පාදුක්ක දෙස සිට ගොඩගම දෙසට ධාවනය වූ යතුරු පැදියක ගැටී අනතුරක් සිදුව එක් යතුරු පැදියක් අසල ඇලකට වැටී ඇත. අනතුරින් යතුරු පැදිකරුවන් දෙදෙනා බරපතල තුවාල ලබා හෝමාගම රෝහලට ඇතුලත් කර ප්‍රථිකාර ලබමින් සිටියදී එක් පැදිකරුවෙකු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 30 ක් වූ මාවත්ගම, පාදුක්ක ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හෝමාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මීගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 12. මාරක රිය අනතුරක් - පලාලි පොලිස් වසම.

2024.09.29 වන දින උදෑසන කාලයේ පලාලි පොලිස් වසමේ පේදුරුතුඩුව කන්කසන්තුරය මාර්ගයේ 36 වන කිලෝමීටර් කණුව ආසන්නයේදී පේදුරුතුඩුව දෙස සිට කන්කසන්තුරය දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන විදුලි රැහැන් කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරු සහ පසු පැදිකරු බරපතල තුවාල ලබා තෙලිප්පලේ රෝහලට ඇතුලත් කර ප්‍රථිකාර ලබමින් සිටියදී පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 18 ක් වූ ඇන්ටනිපුරම්, පලාලි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය තෙලිප්පලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පලාලි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 13. මාරක රිය අනතුරක් - කුඹුක්ගැටේ පොලිස් වසම.

2024.09.29 වන දින රාත්‍රී කාලයේ කුඹුක්ගැටේ පොලිස් වසමේ ඉබ්බාගමුව මඩගල්ල මාර්ගයේ 05 වන කිලෝමීටර් කණුව ආසන්නයේදී ඉබ්බාගමුව දෙස සිට මඩගල්ල දෙසට ධාවනය වූ ලංගම බස් රථයක් එම දිශාවටම ඉදිරියෙන් ධාවනය වූ යතුරු පැදියකට ඉස්සර කිරීමට යාමේදී යතුරු පැදියේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිකරු සහ පසු පැදිකරු බරපතල තුවාල ලබා කුරුණෑගල රෝහලට ඇතුලත් කිරීමේදී පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 38 ක් වූ ඉහලගම, කුඹුක්වැව ප්‍රදේශයේ පදිංචි දොරටියාව පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරි කල පොලිස් කොස්තාපල් රියදුරුවරයෙකි.**

මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර, කුඹුක්ගැටේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය.